**මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පුද්ගලික) සමාගම - 2016**

---

මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පුද්ගලික) සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4** සමාගම පිහිටුවීම

1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ සංස්ථා පිහිටුවීම යටතේ වූ 42(1) වගන්තිය මගින් රු. 100 ක් වූ සාමාන්‍ය කොටස්වලින් සමාගමේ ප්‍රාග්ධනය සමන්විත විය යුතු ලෙස දක්වා තිබුණද මෙම සමාගමේ සාංගමික සංස්ථාපත්‍රය පරිදි අනුදත් ප්‍රාග්ධනය රු. 10 කොටස් 5,000,000 කින් සමන්විතව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 1998 ජූනි 18 දින මෙම සමාගම ලියාපදිංචි කර තිබුණි. සමාගමේ කොටස් 6,384 ක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියටත් එක් කොටසක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ලේකම් ජනරාල් නමටත් නිකුත් කර තිබුණි.

**1.5** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** මූල්‍ය ප්‍රකාශන

**2.1** තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.2.1** කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියන්හි පරිච්ඡේද 17 හි 19 වන වගන්තිය පරිදි ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 3,519,602 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි.ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2** ගිණුම්කරණ අඩුපාඩු

එකතුකළ අගය මත බදු රහිතව විදේශ විශේෂඥයින්ට මාර්තු මාසයේ උපදේශක ගාස්තුව ලෙස රු.4,135,400 ක් ගෙවා තිබුණු අතර එයින් රු.539,400 ක නොගෙවනලද බද්දක් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් ආපසු ලබා ගැනීම නිසා මූල්‍ය ප්‍රකාශනවල වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**2.2.3** පැහැදිලි නොකළ වෙනස්කම්

ශේෂ සනාථකිරීම් අනුව කල්බදු සමාගම් දෙකක ණයහිමි වටිනාකම් පිළිවෙලින් රු.4,850,729 ක් හා රු.892,285 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම් පිළිවෙලින් රු.4,732,952 ක් හා රු.1,000,448 ක් ලෙස දක්වා තිබුණි.

**2.3** ලැබිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 03 ක් ඉක්මවා තිබුණු රු. 1,852,118 ක්වූ ලැබිය යුතු ගිණුම් ශේෂයන් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4** නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත | |
| (i) 39 (1) වගන්තිය | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, ආණ්ඩුවේ අධ්‍යක්ෂවරුන්ගෙන් සහ කොටස්කාර අධ්‍යක්ෂවරුන්ගෙන් සැදුම්ලත් 07 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවත් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තිදෙනෙකුගෙන් පමණක් සමන්විත වී තිබුණි. |
| (ii) 45(1) වන වගන්තිය | සමාගමේ අධ්‍යක්ෂවරුන් අතරින් එක් අධ්‍යක්ෂකවරයෙක් සමාගමේ සභාපති ලෙස තෝරා පත්කර ගතයුතු වුවද රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් සභාපති පත්කර තිබුණි. |
| (ආ) 2011 පෙබරවාරි 11 දිනැති අංක 57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2015 ජනවාරි 31 දිනැති අංක 2/2015 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 08 ඡේදය | සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව ත්‍යාග සඳහා රු.539,000 ක් වියදම් කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දී සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,462,537 ක ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.772,345 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,690,192 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ උපදේශක සේවා සැපයීමෙන් උපයන ලද ලාභය රු.4,834,463 කින් වැඩිවීම ඉහත වර්ධනයට මූලික වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ රු.681,855 ක්ව පැවති සමාගමේ බදු පසු ශුද්ධ ලාභය 2016 වර්ෂයේදී රු.6,462,537 ක් ලෙස වර්ධනය වී තිබුණි. සේවක පාරිශ්‍රමිකය, ජංගම නොවන වත්කම් ක්ෂය හා බදු සැලකිල්ලට ගැනීමේදී 2012 වර්ෂයේ රු.21,010,172 ක්ව පැවති සමාගමේ දායකත්වය අඛණ්ඩව වැඩිවී සමාලෝචිත වර්ෂයේ රු.37,019,119 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සාංගමික සංස්ථා පත්‍රයට අනුව සමාගම පිහිටුවීමේ මූලික පරමාර්ථ අටක් පැවති අතර ඉන් කිහිපයක් පහත වේ. ඒ අනුව එහි සඳහන් විදේශීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අරමුණ ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතුකර නොතිබුණි.

- ලංකාව තුළ සහ ඉන් පිටත ඉඩම් සහ ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිවලට අදාලව ශක්‍යතා අධ්‍යයනයන් සිදුකිරීම, ඉඩම් පරිහරණ සහ ජල සම්පත් ව්‍යාපෘති සැලසුම්කිරීම නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ සමාජ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සැලසුම්කිරීම නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- පාරිසරික ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා අවශ්‍ය සමීක්ෂණයන් සිදුකිරීම සහ සැලසුම් සකස් කිරීම සහ එවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ සමීක්ෂණ සැලසුම් සිදුකිරීම සහ ලංකාව තුළ සහ ඉන් පිටත පරිසර දූෂණය පාලනය කිරීමේ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ මෙහෙයුම්වලට අදාල අංශවල අපේක්ෂිත ක්‍රියාකාරී ඉලක්කයන් දක්වා නොතිබුණු අතර කාර්යසාධන වාර්තාද ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව සකස් කර නොතිබීම හේතුවෙන් සැලසුම්කළ පරිදි එක් එක් අංශවල කාර්යසාධනය ළඟාකරගෙන ඇත්දැයි පරීක්ෂාකළ නොහැකි විය.

**4.2** හදුනාගන්නා ලද පාඩු
---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2000 සිට 2012 කාලසීමාවට අදාලව එකතු කළ අගය මත බදු , ජාතිය ගොඩනැගීමේ බදු සහ උපයන විට ගෙවීම් බදු නිසි පරිදි ප්‍රේෂණය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී සමාගමට රු. 1,810,836 ක දඩ මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) දේශීය ආදායම් පනතේ 61 බී වගන්තිය ප්‍රකාරව නියමිත කාලසීමාව තුළ ලාභාංශ ප්‍රකාශ නොකිරීම හේතුවෙන් 2015 වර්ෂයේ ලාභයට අදාලව සමාලෝචිත වර්ෂයේදී රු. 55,807 ක ලාභාංශ මත බද්දක් ( Deemed dividend tax ) ගෙවීමට සිදු වී තිබුණි.

**4.3** කළමනාකරණ ක්‍රියාකාරකම්
----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 මාර්තු 24 දිනැති අංක 16/0416/704/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මොරගහකන්ද ජලාශයේ මූලස්ථායී වැඩ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවට අදාල සැලසුම් ඇගයීම් කර අනුමත කිරීම සහ ඉදිකිරීම් වැඩ අධීක්ෂණය සඳහා වූ උපදේශක කොන්ත්‍රාත්තුව රු. 167,174,700 ක මුදලකට ( බදු රහිත ) 2016 මාර්තු 15 දින සිට වර්ෂයක් සඳහා සමාගම වෙත ලබා දී තිබුණි. සමාගම විසින් ඒ සඳහා ව්‍යාපෘති කළමනාකරණ අංශයේ දායකත්වය මත උපදේශකවරු තෝරාගැනීමට අදාල ප්‍රසම්පාදන ක්‍රියවලියෙන් බැහැරව මොරගහකන්ද ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් නම්කර එවා තිබූ නිලධාරීන් පස් දෙනෙකු දේශීය උපදේශකයින් ලෙස පත්කර තිබුණි. සමාගම විසින් ඊට අදාල බිල්පත් සකස් කිරීමේ කටයුතු පමණක් සිදු කර තිබුණි. උක්ත කොන්ත්‍රාත්තුවට අදාල විදේශීය උපදේශකයින් සේවයේ යෙදවීම සඳහා පෞද්ගලික උපදේශක ඉංජිනේරු සමාගමට උප කොන්ත්‍රාත්තුවක් ලබා දී තිබුණි.

(ආ) 2011 වර්ෂයේදී සිදුවූ වාහන අනතුරක් සම්බන්ධයෙන් රියදුරුට සහ සමාගමට එරෙහිව වන්දි ඉල්ලා පවරා තිබූ නඩුවක් සඳහා සමාගම සහභාගි වී නොතිබීම මත 2013 ඔක්තෝබර් මස රු.මිලියන 4.5 ක වන්දියක් ගෙවන ලෙස අධිකරණය විසින් මුලින් තීන්දු කර තිබිණි. 2013, 2014 සහ 2015 වර්ෂවල මූල්‍ය ප්‍රකාශනවල ගෙවියයුතු වන්දි වෙනුවෙන් කිසිදු ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණු අතර 2016 වර්ෂයේදී රු. 2,000,000 ක මුදලක් ප්‍රතිපාදනය කර 2017 වර්ෂයේදී එම වන්දි මුදල ගෙවා තිබුණි.

සමාගම් ලේකම්වරිය විසින් මෙම නඩුව සම්බන්ධයෙන් සිය රාජකාරී වගකීම් නිසි පරිදි ඉටුකර නොතිබියදී ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් නොපවත්වා සේවයෙන් ඉවත්වීමට ඉඩ දී තිබුණු අතර අනුමැතියකින් තොරව බඳවාගෙන තිබුණු අනතුරට සම්බන්ධ රියදුරුද අනතුරෙන් පසු විධිමත් පරීක්ෂණයක් නොපවත්වා සේවයෙන් ඉවත්කර තිබුණි.

**4.4** කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම විසින් විශාල ප්‍රමාණයේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා උපදේශක සේවා සැපයීම, විශාල ප්‍රමාණයේ ඉදිකිරීම් සිදුකිරීම හා සැලසුම් සකස් කිරීම වැනි කටයුතු සිදුකළ ද එහි කටයුතු සිදුකිරීමට මුදල් රෙගුලාසි 71 පරිදි අවශ්‍ය නිලධාරීන්ගේ තනතුරු, කාර්ය මණ්ඩල අනුමත කර ගැනීමට හා ඊට අදාලව බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ නීති නිළධාරිණියක් ලෙස ස්ථිර පත්වීමක් දරන අයෙක් සමාගම් ලේකම් ලෙස මාසිකව රු.50,000 ක වැටුපකට කොන්ත්‍රාත් පදනමින් සමාගමට බඳවාගෙන තිබුණි.

(ඇ) සමාගමේ තත්‍ය කාර්ය මණ්ඩලය 28 දෙනෙකු වුවද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාල ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු, උපදේශක (ඉංජිනේරු) ආදි තනතුරු කිසිවක් සඳහා නිලධාරීන් බඳවාගෙන නොතිබුණු බැවින් විශාල ප්‍රමාණයක ව්‍යාපෘති සඳහා උපදේශක සේවා හා ඉදිකිරීම් කටයුතු සඳහා උපකොන්ත්‍රාත් ලබාදීම සිදුකර තිබුණි.

**5.** ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

**5.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කර නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 04 දින හා සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2017 ජුනි 14 දින විගණනය වෙත ඉදිරිපත්කර තිබුණි.

**5.2** අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා සකස්කර තිබුණු අයවැය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර අයවැයගත දත්ත හා තථ්‍ය දත්ත අතර විචලනය සියයට 11 සිට සියයට 121 දක්වා පරාසයක වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6.** පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ණයගැති හා ණය හිමි පාලනය | දිගුකාලයක් නිරවුල් නොවී පවතින ශේෂ නිරවුල් කරගැනීමට පියවර නොගැනීම. |
| (ආ) | මෙහෙයුම් පාලනය | සාංගමික සංස්ථා පත්‍රයේ සඳහන් සියළු අරමුණු ඉටුකර ගැනීමට කටයුතු නොකිරීම. |